᠎
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1947/4 – 2015 දෙසැම්බර් 28 වැනි සඳුදා – 2015.12.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/Q/2014/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මිය, අංක 4ඒ, අමරතුංග මාවත, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, අංක 114, විජේරාම මාවත, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77, ටී. පියසෝම මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 09 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/Q/2014/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මිය, අංක 4ඒ, අමරතුංග මාවත, තලපත්පිටිය පාර, උඩහමුල්ල, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, අංක 114, විජේරාම මාවත, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පරිපාලන නිලධාරි (වැඩසටහන්) II ශ්‍රේණිය ලෙස උසස්වීම් ලබා 2012.12.20 දින සිට 2013.12.31 දින දක්වා සේවය කල ආර්. ඒ. ඩී. එන්. රූපසිංහ මහත්මියට ලබා දී තිබූ එම තනතුර අවලංගු කර 2014.01.01 දින සිට නැවත පෙර සිටි තනතුරට පත් කිරීම යුක්ති සහගත වන්නේද? යන්න හා එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2015 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 - 455

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.